**මාවතගම ප්‍රාදේශීය සභාව**
**කුරුණෑගල දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 26 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මාවතගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඉඩම් සහ ගොඩනැගිලි වටිනාකම රු. 3,825,000 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කරමි. |
| (ආ) | වටිනාකම රු.33,818,315ක් වූ ගිණුම් ශේෂයන් 13 කට අදාළව සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ගිණුම් ශේෂය තහවුරු කෙරෙන විගණන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේදී ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කරන අතර ලේඛන , උප ලේඛන හා කාල විශ්ලේෂණ ඉදිරිපත් කරමි. |

**1.4** **අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| | **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **අනුකූල නොවීම** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|---|
| **(අ)** | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 143 (1) වගන්තිය | 2016 වර්ෂයේ දේපල 13 ක හා 2017 වර්ෂයේ දේපල 13 ක වෙනස්කිරීම් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | පනතට අනුකූලව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී කටයුතු කරමි. |
| **(ආ)** | 1988 අංක 56 දරන ජාතික පාරිසරික පනතින් සංශෝධිත 1980 අංක 47 දරන පාරිසරික පනතේ 26 වන වගන්තිය | පරිසර බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාරික ස්ථාන 08 ක් පරිසර බලපත්‍ර ලබානොගෙන ව්‍යාපාර කටයුතුවල නිරත වී තිබුණි. | නීතිරීති රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී කටයුතු කරමි. |

**02.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 30,308,129 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 29,726,634 ක් විය.

**2.2** **ආදායම් පරිපාලනය**

**2.2.1** **ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 වර්ෂය<br>ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2017 වර්ෂය<br>ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 4,960 | 9,609 | 4,769 | 4,840 | 4,760 | 5,090 | 3,936 | 4,414 |
| බදු කුලී | 10,099 | 12,313 | 10,180 | 2,132 | 8,565 | 7,458 | 7,286 | 2,638 |
| බලපත්‍ර ගාස්තු | 602 | 397 | 326 | 70 | 802 | 281 | 281 | 70 |
| වෙනත් | 107,422 | 107,603 | 74,991 | 32,611 | 115,616 | 105,043 | 82,936 | 77,195 |
| එකතුව | 123,083 | 129,922 | 90,266 | 39,653 | 129,743 | 117,872 | 94,439 | 84,317 |

### 2.2.3 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු. 4,414,043 ක් වූ ආරම්භක හිඟයෙන් වර්ෂය තුළ අයකර තිබුණේ රු. 538,534 ක් හෙවත් සියයට 12 ක් පමණි. මේ අනුව සභාවේ හිඟ ආදායම් අය කිරීමේ ප්‍රගතිය පහළ මට්ටමක පැවතුණි. | හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතු වේ. | හිඟ ආදායම් අය කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. |

### 2.2.4 කුලී

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මාවතගම පොදු වෙළඳපොල කඩ කාමර 15 ක් රු.720,000 කට බදු දීමට අදාළ බදු ගිවිසුමේ 23 වගන්තියේ සදහන් කරුණුවලට අනුකූල නොවන පරිදි බදුකරුවන් විසින් වෙනත් පාර්ශවයන්ට මාසික කුලී පදනම මත අතුරු බදු දීම තුළින් රු.3,570,000 ක මුදලක් වාර්ෂිකව උපයා ගෙන තිබුණි. අතුරු බදු දීම සම්බන්ධයෙන් බදු ගිවිසුමේ 34 වගන්තිය ප්‍රකාරව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අතුරු බදු දීම සම්බන්ධයෙන් බදු ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | වර්තමාන හිමිකරුවන්ට පැවරීමට කොමසාරිස්වරයාගේ අනුමැතිය යටතේ කටයුතු කරමි. |

| | | |
|---|---|---|
| (ආ) කඩ කාමර බදු ගිවිසුමේ 23 වගන්තිය ප්‍රකාරව බදුකරුවන් විසින් කඩ කාමරවල භුක්තිය වෙනත් අයකුට විකිණීම හෝ පැවරීම නොකළ යුතු වුවත් මාවතගම පොදු වෙළඳපොල කඩ කාමර 06 ක බදුකරුවන් රු.7,800,000 ක මුදලකට වෙනත් පාර්ශවයන්ට විකිණීම හෝ පැවරීමට කටයුතු කර තිබුණු අතර බදු ගිවිසුමේ 12 වගන්තියට පටහැනිව සභාවේ අනුමැතියකින් තොරව ඇතැම් කඩ කාමර කොටස් වෙන් කර තිබුණි. අංක 17 හා 24 දරන කඩ කාමර එලෙස කොටස් කර වෙනත් පුද්ගලයන්ට බදු දී තිබූ නමුත් මේ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | කඩ කාමරවල භුක්තිය වෙනත් අයකුට විකිණීම හෝ පැවරීම විධිමත්ව සිදු කළ යුතුය අතර බදු ගිවිසුමේ වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | වර්තමාන හිමිකරුවන්ට පැවරීමට කොමසාරිස්වරයාගේ අනුමැතිය යටතේ පරික්ෂා කර බලා ඉදිරියේදී කටයුතු කරමි. |

**2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 2,332,333 ක් හා මුද්දර ගාස්තු රු. 40,000,000 ක් විය. | හිඟ ආදායම් රැස් කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ලැබිය යුතු ආදායම් වටිනාකම නිවැරදිය. |

## 03. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කරුණු විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණ පහසුව හා සුභ සාධනය සඳහා සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු වුවත්, 2018 දෙසැම්බර් 31 දින වන විට කාරණා 14 ක් සම්බන්ධයෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | සභාවේ අවශ්‍යතාවය පරිදි අතුරු ව්‍යවස්ථා සකස් කිරීම සහ පනවා ඇති අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී කටයුතු කරමි. |

(ආ) අතහැර දැමූ කර්තව්‍යන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා නව ගොඩනැගිල්ල ඉදිකිරීමේ ගොඩනැගිලි සැලසුම් සඳහා 2014 හා 2015 වර්ෂවලදී රු. 693,874 ක මුදලක් පෞද්ගලික සැලසුම් ආයතනයකට ගෙවා ඇතත්, ඉදිකිරීම් ආරම්භ කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේ රු. 2,300,753 ක් වැය කර පැරණි සභා රැස්වීම් ශාලාව අලුත්වැඩියා කර තිබුණි. | සැලසුම් සහගතව සභා අරමුදල් වැය කිරීමට කටයුතු කළ යුතු වේ. | අවශ්‍යතාව මත නව සභා ගොඩනැගිල්ල අළුත්වැඩියා කර ඇත. ඉදිරියේදී සැලසුම අනුව කටයුතු කරමි. |

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (ii) කොම්පෝස්ට් හලර් යන්ත්‍රය අක්‍රිය වීම හා බේල් යන්ත්‍රයක් භාවිතා කර පොලිතීන් ඉවත් කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් පොහොර නිෂ්පාදන කටයුතු අකාර්යක්ෂමව පැවතුණි. | කොම්පෝස්ට් ව්‍යාපෘතියේ කාර්යයන් කාර්යක්ෂමව කළ යුතු වේ. | හලර් යන්ත්‍රය අළුත්වැඩියා කරනු ලැබේ. බේල් යන්ත්‍රය මිලදී ගැනීමට මිල ගණන් කැඳවා ඇත. |
| (iii) වර්ෂ 03 කට පමණ පෙර වැසිකිලි අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා මධ්‍යස්ථානක් ඉදිකර තිබුණද, ඉදිකිරීම් දෝෂ හේතුවෙන් කාර්යයන් ආරම්භ කර නොතිබීම නිසා වැසිකිලි අපද්‍රව්‍ය, මධ්‍යස්ථාන භූමියේ වැළලීම සිදුකර තිබුණි. | අපද්‍රව්‍ය සෞඛ්‍යාරක්ෂිතව බැහැර කිරීමට කටයුතු කළ යුතු වේ. | මේ සඳහා කඩිනමින් කටයුතු කරමින් පවතී. |

**3.2 කළමණාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මාවතගම නගර මධ්‍යයේ අනවසර ඉදි කිරීමක් සම්බන්ධයෙන් වර්ෂ ගණනාවක සිට ලිපිගොනුවක් විවෘත කර කටයුතු කරමින් පැවතියද 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | නඩු පැවරීමට කටයුතු කර ඇත. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අනුමත කාර්ය මණ්ඩලය තුළ තනතුරු 09 කට අදාලව නිලධාරීන් 49 ක අතිරික්තයක් පැවතුණි. ඒ අතර සංවර්ධන නිලධාරීන් 17 ක් විය. | අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් අනුයුක්ත කළ නිලධාරීන් පිරිසකි. |
| (ආ) | සභාවේ සේවය කර විශ්‍රාම ගිය, මියගිය හා ස්ථාන මාරු වී ගිය සේවකයින් 11 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු සේවක ණය ශේෂය රු. 553,252 ක් විය. | අයවිය යුතු සේවක ණය නියමිත පරිදි අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | සේවක ණය අය කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. විශ්‍රාම සේවකයින්ගේ පාරිතෝෂික ගෙවීමේදී ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කරමි. |

**3.4 ප්‍රසම්පාදනය**

**කොන්ත්‍රාත් පරිපාලනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වාහන අංගනය ඉදිකිරීමේ කර්මාන්තයේ අදියර 01 හි වැඩ විෂය අංක 12 හා අදියර 02 හි වැඩ විෂය අංක 11 යටතේ මි.මී 0.47 සින්ක් ඇළුමිනියම් සෙවිලි තහඩු වහලයට යොදා ඇති බවට දක්වා රු.574,454 ක් ගෙවීම් කර ඇතත් භෞතික විගණන | නියමිත පිරිවිතර අනුව ඉදිකිරීම් කටයුතු විධිමත්ව ඉටු කළ යුතු වේ. | කැලිබර් උපකරණය මගින් පැහැදිලි මිණුම් ලබා ගැනීම නොහැකි වීම නිසා නිවැරදිව මිණුම් කිරීමට නොහැකි විය. |

| | | | |
|---|---|---|---|
| | පරික්ෂාවේදී එම සෙවිලි තහඩු මි.මී 0.40 ප්‍රමාණයට ආසන්නව පැවතුණි. | | |
| (ආ) | මහාසභා රැස්වීම් ශාලාවට ප්‍රවේශවීමේ මාර්ගයට කුට්ටිගල් ඇල්ලීමේ ඇස්තමේන්තුව අනුව කොන්ක්‍රීට් ආධාරක බැම් උස මි.මී 225 ක් හා පළල මි.මී 150 ක් වනසේ ඉදි කිරීම් කල යුතු වුවත්, භෞතික පරික්ෂාවට අනුව උස මි.මී. 100 ක් හා පළල මි.මී. 140 කින් යුක්තව ඉදිකිරීම් සිදුකර තිබුණි. | ඉදිකිරීම් කටයුතු විධිමත්ව ඉටු කළ යුතු වේ. | ඇස්තමේන්තුවේ සඳහන් පිරිවිතරයන්ට අනුව නැවත ඉදිකිරීම් කර දෙන ලෙසට කොන්ත්‍රාත්කරුට දැනුම් දී ඇත. |